# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகம் திணைக்களம்
## REGISTRAR GENERAL'S DEPARTMENT

RG/AB/02/05/59-III (ARG බඳවාගැනීම් 2020)

මගේ අංකය / எனது இல. / My No.

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.


දිනය / திகதி / Date 2022.07.21

සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඉඩම් රෙජිස්ට්‍රාර් තනතුරුවල රාජකාරි ආවරණ/ වැඩ බැලීම සඳහා අයදුම්පත් කැඳවීම.**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඉඩම් රෙජිස්ට්‍රාර් තනතුරුවල රාජකාරි ආවරණය කිරීමට හෝ වැඩ බැලීමට සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, නො 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඉඩම් රෙජිස්ට්‍රාර් තනතුරුවල රාජකාරි ආවරණ/ වැඩ බැලීම සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමන් රෙජිස්ට්‍රාර් සේවයට බැඳුනු භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය - 2022.08.05

**සටහන:** අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට හා භාගත කිරීමට rgdaddapplication@gmail.com යන ඊ - තැපැල භාවිතා කරන්න. එමඟින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2022.08.05 දින මධ්‍යම රාත්‍රී 12.00 ට ප්‍රථම ඊ - තැපැල මඟින් යොමු කරන ලෙස කාරුණිකව දන්වන අතර, දෘඩ පිටපත තැපැල මඟින් හෝ අතින් ප්‍රධාන කාර්යාලය වෙත භාරදීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

**01. ඉල්ලුම් කිරීමේ ක්‍රමය**

I. ඉල්ලුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A-4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 1.0 – 6.0 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද, 7.0(a) – 8.0 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවටද, 9.0 – 14.0 තෙක් තුන්වන පිටුවටද, ඉතිරිය හතරවන පිටුවටද වන ලෙස ගෙන කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II. අදාළ ඉල්ලුම්පතේ ඉල්ලුම්කරුගේ අත්සන සහතික කිරීම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් වරයෙකු/ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් වරයෙකු විසින්ම සිදු කළ යුතු වේ.

**සැලකිය යුතුය:**

අ. නිලධාරීන් විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කරන අයදුම්පත් දෙපාර්තමේන්තුවට ලැබුණු දිනයේදීම දින මුද්‍රාව තැබීමත්, අයදුම්කරු විසින් සඳහන් කරන තොරතුරු නිවැරදි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කිරීමත්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සිදු කළ යුතු වේ. එසේ කිරීමට හැකි වන පරිදි අයදුම්පත් නියමිත දිනට පෙර යොමු කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වේ.

ආ. සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය අයදුම්කරුගේ නමින් අයදුම්කරුගේ කාර්යාලයීය ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ.

ඇ. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

ඈ. පත්වීම සඳහා සුදුසුකම් ලබන යම් අයදුම්කරුවෙකු එම පත්වීම පිරිනමන අවස්ථාවේදී බලපැවැත්වෙන රෙගුලාසි හා විධිවිධානයන් යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ, හැසිරීම කරණ කොටගෙන හෝ පත්වීම් නොදීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

ඉ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීමද මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

**පී.එස්.පී. අබේවර්ධන**
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව